# ඩිජිටල් තාක්ෂණයේ නවෝදය කැල්සි ටෙක්නොලොජීස්

**චන්දන විජේකෝන්**

කැල්සි යන්න කැලිෆෝර්නියා හා සිලෝන් යන වචනවල සංයෝගයකි. තිස් වසරකට පෙර මහින්ද කරුණාරත්න විසින් අරඹන ලද කරුණාරත්න හා පුත්‍ර සමාගම මූලික වශයෙන් දින පොත් ඇසුරුම් හා වාණිජමය මුද්‍රණ කර්මාන්තයේ යෙදී සිටී.



**කැල්සි ටෙක්නොලොජීස් සමාගම විවෘත කිරීමේ උත්සවයට සහභාගි වූ නෙවිල් නානායක්කාර මහතා පොල් තෙල් පහන දල්වයි. එම ආයතනයේ ප්‍රධාන විධායක මංගල කරුණාරත්න මහතා ද මෙහි වෙයි.**

මුද්‍රණ කර්මාන්තයේ ගුණාත්මක බවට කීර්ති නාමයක් හිමි කේ සහ එස් ඉකුත් වසරේ ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමයේ සම්මාන උළෙලේදී දින පොත් මෙන්ම තවත් සම්මාන ද දිනාගන්නා ලදී.

කැල්සි කේ සහ එස් නවතම අනුබද්ධ ආයතනයයි. එය ඩිජිටල් ආර්ථිකයේ නවයුගයක් කරා සමාගම ගෙන යන්නකි.

මාස කීපයකට පෙර කැල්සි ඇරඹුණේ ඒ ඕ එල් (AOL) ටයිම් වෝනර් හා නෝටෙල් නෙට් වර්ක් වැනි සිලිකන් වැලි අධිතාක්ෂණ කර්මාන්තයේ පළ පුරුදු කළමනාකාරිත්වය සමඟ එක් වූ කේ ඇන්ඩ් එස් (K & S) ව්‍යාපාරික හසලත්වය හා ආයෝජනය සමඟ බැඳෙමිනි. ලොව පුරා ව්‍යාප්ත ඒකාබද්ධ බෙදාහැරීම් පද්ධතියක් මගින් ශ්‍රී ලංකාවේ ඒ හා සමාන බෙදාහැරීම් ක්‍රියාවලියක නිරත වීමට කැල්සි ආයතනයට හැකිව තිබේ. කොළඹ සංවර්ධන මධ්‍යස්ථානය සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නා අතරම සැලසුම් හා සංකල්ප සඳහා සැන්ෆ්රැන්සිස්කෝ සහ සී ඒ පදනම් සැලසුම්ගාර යොදා ගැනේ.

දෙස් ව්‍යාපෘති 4 ක් සාර්ථක ලෙස නිමවා ඇති කැල්සි දැන් ශ්‍රී ලංකාවේ විශාල ම විද්‍යුත් වාණිජ මධ්‍යස්ථානයක කටයුතු කරයි.

## අසාමාන්‍ය සේවාවක්

විකුණුම් හා අලෙවිය සමඟ අසමාන සේවාවක් සැපයීමට කැල්සි ආයතනය ඇමෙරිකානු සමාගම් කීපයක් සමඟ හවුල් වී සිටී. එමගින් කැරෙන කාර්ය අතර මුද්‍රිත මාධ්‍ය හා බහු මාධ්‍ය සැලසුම්, මෘදුකාංග සංවර්ධනය, වෙබ් අඩවි නිර්මාණය හා දත්ත පදනම් ගොඩනැගීම ආදිය වේ.

කැල්සි ටෙක්නොලොජි සමාගම කැලිෆෝර්නියාව පදනම් කරගත් ශ්‍රී ලාංකීය වෙබ් ඉන්ටර්නෙට් සමාගමකි. විවිධ ව්‍යාපාරික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වන අන්තර් ක්‍රියාකාරිත්වයන් රැසක්ම සැපයීමට එය කැපවී සිටී. සමාගමේ අනුග්‍රාහකයින්ට ඉන්ටර්නෙට් ඉන්ට්‍රානෙට් කාර්යයන් මගින් ආදායම වැඩි කරගැනීමට, පිරිවැය අඩු කරගන්නට හා වෙළෙඳ පොළක් හිමිකැර ගැන්මට එය සහාය වෙයි. අප ගොඩනගන ව්‍යාපාරික සබඳතා එකිනෙකේ අරමුණු වන්නේ හුදු වෙළෙන්දකුට වඩා වන කාර්යක නියැලෙමින් වැදගත් හවුල් කරුවකු ලෙස පෙනී සිටීමයි. පිරිවැය පලදායි හා ප්‍රතිඵල දායි ජයග්‍රහණයන් වරින් වර අපේ අනුග්‍රාහකයින්ට ලබාදීමෙන් අපි අඛණ්ඩ සාර්ථකත්වයක් හිමි කැරගෙන ඇත්තෙමු.

විද්‍යුත් වානිජ්‍ය අන්තර්ජාල යෙදුම් සංවර්ධන වෙබ් අඩවි සැලසුම් කිරීම, සංවර්ධන කටයුතු හා දිරි ගැන්වීම්, උපරිම සෝදිසි යාන්ත්‍රණය, අන්තර් ක්‍රියාකාරි බහු මාධ්‍ය සී.ඩී., ඩී.වී.ඩී. වී.සී.ඩී. වීඩියෝ නිෂ්පාදන ඉන්ටර්නෙට් අලෙවිකරණය හා මුද්‍රිත මාධ්‍ය සැලසුම් ආදිය අපේ සේවාවන්ට ඇතුළත් ය.

## වෙබ් අඩවි

කැල්සේ සමාගම වෙබ් අඩවි සැලසුම් කිරීම හා ගොඩනැගීම සිදු කරන්නේ ඔවුන්ගේ පරිපූර්ණ සේවාවලියේ කොටසක් ලෙස ය. නිර්මාණාත්මක ක්‍රියාවලිය පුරා අපේ අනුග්‍රාහකයින් සමඟ විවෘත සන්නිවේදනයක් පවත්වා ගැනීමේ පහසුව උදෙසා අපේ උපදේශාත්මක පිවිසුම් ගොඩනැගීම් ක්‍රමවේදය තුළට ඇතුළත් කැර තිබේ.

වෙබ් අඩවි සැලසුම් කිරීමෙහිලා වසර ගණනාවක පළපුරුද්දක් කැල්සි සමාගම සතු ය. පුළුල් පරාසයක කර්මාන්තවලට ඔවුන්ගේ අවශ්‍යතාවන් එළදායී ව ඉටුකැර ගත හැකි පරිද්දෙන් එම වෙබ් අඩවි නිමවා ඇත. අපේක්ෂිත ඉලක්කගත ප්‍රේක්ෂක පිරිස සමඟ සන්නිවේදනයේ යෙදිය හැකි අයුරින් සාර්ථක ලෙස වෙබ් අඩවි නිමැයීමෙහිලා අප සතු හැකියාව පසුගිය කාලය තුළ මුවහත් කැර ඇත්තෙමු.

වෙබ් අඩවි භාවිතයන් ගොඩනැගීම මූල්‍යමය හිරිහැරයක් ලෙස සමහර සමාගම් සලකයි. එහෙත් ඔබේ මූල්‍යමය හැකියාවන් තුළ ඒවා සැපයීමට කැල්සි සමාගමට හැකි ය.

මෙහි දී භාවිත ගොඩනැගීම දත්ත හැඩගැසීම දත්ත පිවිසුම ක්‍රියාත්මක කිරීම සත්කාරකත්වය නඩත්තුව හා සහාය ඇතුළත් පරිපූර්ණ ක්‍රියාවලියක වගකීම අපට දැරිය හැකි ය.